දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

ගරු අමාත්‍ය / அமைச்சர் / Minister — 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / கோட்டை / Secretary — 2784811

Kotte
කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
"இசுருபாயா" ஸ்ரீ ஜயவர்தனபுர
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura
Battaramulla.

පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව

ඔබේ අංකය / உமது இல. / Your No. ..........................................

මගේ අංකය / எமது இல. / My No. ED/01/12/01/01/ [illegible]

දිනය / திகதி / Date 2010.04.23

චක්‍රලේඛ අංක . 2010/19

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්.
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්.
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්.
සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්.
සියලුම පාසල්වල විදුහල්පතිවරුන් හා
සියලුම පිරිවෙන්වල පරිවේණාධිපති හිමිවරුන් වෙත.

## පළාත් රාජ්‍ය සේවයෙන් ජාතික පාසල් සේවයට සේවා අවශ්‍යතා මත ගුරුභවතුන් බඳවා ගැනීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක.ආ.සේ.ක/ගුරු5/ හා 2003.06.10 දිනැති ලිපිය අනුව 1989.12.31 දිනට පෙර මුල් පත්වීම් ලැබූ ගුරුභවතුන්ට පමණක් ජාතික පාසල් සේවයට ස්ථාන මාරුවීම් ලබා ගැනීමට පනවා තිබූ සීමාව අංක.09/1991/316/071 හා 2009.10.28 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව ඉවත් කිරීමට තීරණය කළ බැව් මෙයින් දැනුම් දෙමි.

ඒ අනුව. මුල්පත්වීම් දිනය නොසලකා ගුරුභවතුන්හට සේවා අවශ්‍යතා මත ජාතික පාසල්වල පවතින ඒ ඒ විෂයය පුරප්පාඩු සඳහා ස්ථාන මාරුවීම් ලබා දිය හැකි ය.

ඒ ඒ පළාත් සභාවලින් තීරණය කරනු ලබන කොන්දේසිවලට යටත්ව නිදහස් කළ හැකි විෂයයන්ට අදාළ ගුරුභවතුන් පමණක් ජාතික පාසල් සේවයට නිදහස් කිරීමට පළාත් බලධාරීන් විසින් කටයුතු කළ යුතු ය. එම පළාතේ සේවය කොට ඇති කාලසීමාව හා පළාත විසින් තීරණය කරනු ලබන අනෙකුත් කොන්දේසිවලට යටත් ව මෙම නිදහස් කිරීම සිදු කළ යුතු ය.

ජාතික පාසල් සේවයට බඳවා ගැනීමේ දී ජාතික පාසල් පද්ධතියේ ගුරු ඌනතා පවතින විෂයයන් සඳහා පමණක් පළාතෙන් නිදහස් කරන ගුරුභවතුන් බඳවා ගැනීමට කටයුතු කරනු ලබන අතර මෙහිදී පළාත් රාජ්‍ය සේවයේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ද මුල් පත්වීම් ලිපිය මඟින් පත්කොට ඇති පාසලේ අනිවාර්ය සේවා කාලයක් නියම කොට ඇත්නම් එම කාලසීමාව සම්පූර්ණ කොට තිබීම ද අත්‍යාවශ්‍ය වේ. මෙලෙස ජාතික පාසල් සේවයට බඳවා ගැනීමේ දී මීට පෙර පළාත් රාජ්‍ය සේවයෙන් ගුරුභවතුන් ජාතික පාසල් සේවයට ස්ථාන මාරු කිරීමේ දී අනුගමනය කළ විධිමත් ක්‍රියාපටිපාටිය ම අනුගමනය කරනු ඇත.

මෙලෙස ජාතික පාසල් සේවයට බඳවා ගන්නා ගුරුභවතුන් ස්ථාන මාරු කරන ලද ජාතික පාසලේ වසර 03 ක අවම සේවා කාලයක් සම්පූර්ණ කළ යුතු වේ.

එම්.එම්.එන්.ඩී.බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය